**ශීර්ෂය 201 - බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2016 වර්ෂය**

ශීර්ෂය 201 - බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුවේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2017 ඔක්තෝබර් 27 දින දෙපාර්තමේන්තුවේ කොමසාරිස් ජනරාල්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් හා සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය හා ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 2. ගිණුම්

### 2.1 විසර්ජන ගිණුම

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

දෙපාර්තමේන්තුව සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 1,264.76 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 1,146.43 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව දෙපාර්තමේන්තුව වෙත සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 118.33 ක් හෙවත් සියයට 9.36 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2016 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 1,216.49 | 1,102.16 | 114.33 | 9.40 |

| | | | | |
|---|---|---|---|---|
| මූලධන | 48.27 | 44.27 | 4.00 | 8.29 |
| | ---------- | ----------- | ---------- | |
| එකතුව | 1,264.76 | 1,146.43 | 118.33 | 9.36 |
| | ====== | ======= | ====== | |

**2.2 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

දෙපාර්තමේන්තුවට අදාළ විෂය අංක 20101 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ .

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 25.00 | 24.35 | 15.00 | 18.68 | 58.00 | 46.87 |

**2.3 පොදු තැන්පත් ගිණුම**

දෙපාර්තමේන්තුව යටතේ වන තැන්පත් ගිණුම් 04 ක 2016 දෙසැම්බර් 31 දිනට ශේෂ එකතුව රු.මිලියන 2.36 ක් විය. විස්තර පහත දැක්වේ.

| තැන්පත් ගිණුම් අංකය | 2016 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|
| | රු.මිලියන |
| 6000/0000/00/0001/0036/000 | 0.55 |
| 6000/0000/00/0002/0047/000 | 0.05 |
| 6000/0000/00/0018/0001/000 | 0.14 |
| 6000/0000/00/0019/0002/000 | 1.62 |
| එකතුව | 2.36 |

## 2.4 විගණන නිරීක්ෂණය

බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුවේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති පරිදි කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

## 3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

### 3.1 විසර්ජන ගිණුම

**අයවැය විචලනය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ)** වැය විෂයක් සඳහා සළසා තිබුණු රු. 800,000ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.

**(ආ)** වැය විෂයයන් 13 ක් සඳහා අධි ප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාළ ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 15 සිට සියයට 93 අතර පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

**(ඇ)** සමාලෝචිත වර්ෂයට අදාළ නමුත් 2017 වර්ෂයේ දි නිරවුල් කරන ලද එකතුව රු.200,094 ක් වූ බැරකම්, බැරකම් පිළිබඳ ප්‍රකාශනයේ දක්වා නොතිබුණි.

### 3.2 පොදු තැන්පත් ගිණුම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

අංක 6000/00/00/0019/0002 දරන ප්‍රදාන (දේශීය) ගිණුමේ 2016 දෙසැම්බර් 31 දිනට රු.1,616,102 ක ශේෂයක් තිබූ අතර, ඉන් සියයට 93 ක් වූ රු.1,511,632 ක් අදාළ අරමුණු වූ සිසු නිපුණතා වැඩ සටහන, වෙසක් උත්සවය, බෞද්ධ කොඩි සැපයීම, විහාර සංවර්ධන දැනුවත් කිරීමේ වැඩසටහන වැනි දෑ සඳහා යොදා ගැනීමෙන් තොරව වසරකට වඩා වැඩි කාලයක් රඳවාගෙන තිබුණි. 2017 වර්ෂය තුළදී මෙම තැන්පතු ශේෂයෙන් රු.366,872 ක් රජයේ ආදායමට බැර කර තිබූ අතර රු.977,232 ක් අරමුණු ඉටු කිරීම වෙනුවෙන් ගෙවා තිබුණි. ඒ අනුව 2017 නොවැම්බර් 30 දිනට ශේෂය රු.251,998 ක් විය.

### 3.3 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

විෂය අංක 20101 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2016 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ)** විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.681,447 ක් වූ අතර, එම ශේෂ වර්ෂ 01 සිට වර්ෂ 03 ක් දක්වා කාල පරාසයක සිට හිඟහිටව පැවතුණි. එම හිඟහිටි ණය ශේෂවලින් රු.569,977 ක් 2017 නොවැම්බර් 30 දින වන විට අයකර ගෙන තිබූ අතර රු.111,470 ක ශේෂයක් තවදුරටත් හිඟහිටව පැවතුණි.

(ආ) 1994 අගෝස්තු 10 දිනැති අංක 96 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 05 ඡේදය අනුව, උපලේඛන සකස් කිරීමේදී අදාළ දිනයන්ද, අවශ්‍ය පරිදි අවසන් වරට ණය වාරික අයකළ දිනයන්ද සඳහන් කළ යුතු වුවත් එසේ කර නොතිබුණි.

## 3.4 යහ පාලනය හා ගිණුම් කටයුතුභාවය

### 3.4.1 අභ්‍යන්තර විගණනය

දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන ඒකකය විසින් 1931 අංක 19 දරන විහාර දේවාලගම් පනතින් පාලනය වන විහාර හා දේවාලගම් සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණන පරීක්ෂාවන් සිදුකර තිබුණද, එමගින් පෙන්වා දී තිබුණු අඩුපාඩු නිවැරදි කිරීමට දෙපාර්තමේන්තුව විසින් ප්‍රමාණවත් පියවර ගෙන නොතිබුණි.

### 3.4.2 වත්කම් කළමනාකරණය

**වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

බෞද්ධ විශ්ව කෝෂය පිළියෙල කිරීම සඳහා පරිශීලනය කරන ලද දේශීය සහ විදේශීය විවිධ භාෂාවන්ගෙන් යුත් වටිනා පොත් 1753 ක් දෙපාර්තමේන්තුව යටතේ ඇති බෞද්ධ විශ්වකෝෂ කාර්යාලය සතුව පැවතියද එම පොත් සඳහා වාර්ෂික සමීක්ෂණ කටයුතු සිදු කර නොතිබුණි.

### 3.4.3 බැරකම්වලට එළඹීම

මුදල් රෙගුලාසි 94(1) ට පටහැනිව සලසා තිබුණු ප්‍රතිපාදන උපයෝජනය කළ පසු ඉතිරිය ඉක්මවා රු.මිලියන 48.97ක බැරකම්වලට එළඹ තිබුණි.

## 3.5 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවල දී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
| --- | --- | --- |
| | රු. | |
| **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | |
| (අ) මුදල් රෙගුලාසි 395 (ඇ) | - | 2016 වර්ෂයේ සැප්තැම්බර් සිට දෙසැම්බර් දක්වා මාස 4 ක කාලයක් සඳහා බැංකු සැසඳුම් ප්‍රකාශ 2017 ජුනි මාසයේ සකස් කර තිබුණි. |

| | | |
|---|---|---|
| **(ආ)** මුදල් රෙගුලාසි 454 | 2,200,110 | සමාලෝචිත වර්ෂයේ මිලදී ගෙන තිබූ රු.257,025 ක් වටිනා ගෘහභාණ්ඩ හා කාර්යාල උපකරණ සහ රු.1,943,085 ක් වටිනා යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ සඳහා ගබඩා ලේඛන ඉදිරිපත් කර නොතිබුණි. |

**3.6 කාර්යසාධනය**

------------------

**ප්‍රමාණවත් ලෙස ඉටුනොකළ ප්‍රධාන කාර්යයන්**

--------------------------------------------------

දෙපාර්තමේන්තුව ප්‍රධාන කාර්යයන් ප්‍රමාණවත් ලෙස ඉටු නොකර තිබුණු අතර, එසේ නිරීක්ෂණය වූ අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

**1931 අංක 19 දරන විහාර දේවාලගම් ආඥා පනත ක්‍රියාත්මක කිරීම**

---------------------------------------------------------------------------

**(අ)** 1931 අංක 19 දරන විහාර දේවාලගම් ආඥා පනතේ 36 (2) වගන්තිය ප්‍රකාරව අර්ධ වර්ෂය අවසාන වී දින 30 ක් ඇතුළත, විහාර හා දේවාල විසින් අර්ධ වාර්ෂික අයවැය වාර්තා බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල් වෙත ඉදිරිපත් කළ යුතුය. ඒ අනුව ඉදිරිපත් කර තිබූ අර්ධ වාර්ෂික අයවැය වාර්තා හා වාර්ෂික ඇස්තමේන්තු අතර සියයට 6 සිට සියයට 127 දක්වා විචලනයන් පවතින බව විගණනයේ දී නිරීක්ෂණය විය. දෙපාර්තමේන්තුව විසින් ඇස්තමේන්තු හා අර්ධ වාර්ෂික අයවැය වාර්තා පිළිබඳ පරීක්ෂාකර විචලනයන්ට හේතු විමර්ශනය කර නොතිබුණි. පෙර වර්ෂ පරිදිම ඇස්තමේන්තු හා අර්ධ වාර්ෂික අයවැය වාර්තා ලබාගෙන තිබීම හැර විහාර හා දේවාලවල මූල්‍ය පාලනය සම්බන්ධව ඵලදායි පියවර ගෙන නොතිබුණි.

**(ආ)** 1931 අංක 19 දරන විහාර දේවාලගම් ආඥා පනතේ 36 (2) වගන්තිය ප්‍රකාරව විහාර හා දේවාල විසින් ඉදිරිපත් කරන ලද අර්ධ වාර්ෂික ගිණුම් වාර්තාවල සඳහන්, ඒ ඒ වර්ෂවලදී දේපළ හා වත්කම් ආදියට සිදු වූ වැඩිවීම් හා අඩුවීම් පිළිබඳ විස්තරාත්මක වාර්තා ලබා ගැනීමට දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි.

**3.7 කළමනාකරණ දුර්වලතා**

----------------------------

**බෞද්ධ විශ්වකෝෂය සඳහා කතෘවරුන් බඳවා ගැනීම, මුද්‍රණය කිරීම හා අලෙවි කිරීම**

------------------------------------------------------------------------------------------

නියැදි විගණන පරීක්ෂණවල දී පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය.

**(අ)** බෞද්ධ විශ්වකෝෂයේ ප්‍රධාන කර්තෘ තනතුර 1990 වර්ෂයේ සිට ද නියෝජ්‍ය කර්තෘ තනතුර 2004 වර්ෂයේ සිට ද පුරප්පාඩු වී ඇති අතර , එම පුරප්පාඩු 2016 දෙසැම්බර් 31 දින දක්වාම සම්පූර්ණ කර නොතිබීම හේතුවෙන් බෞද්ධ විශ්වකෝෂයේ කටයුතු නිම කිරීමට නොහැකි වී තිබුණි.

**(ආ)** බෞද්ධ විශ්වකෝෂයේ නැවත සංස්කරණ කටයුතු සිදු විය හැකි බැවින්, සුදුසුකම්ලත් ස්ථිර කර්තෘ මණ්ඩලයක අවශ්‍යතාවය පිළිබඳව දෙපාර්තමේන්තුව සැලකිල්ලක් දක්වා නොතිබුණි.

**(ඇ)** ජාත්‍යන්තර අවශ්‍යතාවයක් ලෙස සලකා ඉංග්‍රීසි භාෂාවෙන් බෞද්ධ විශ්ව කෝෂය නිර්මාණය කර එය ජාත්‍යන්තරයට ප්‍රචලිත කිරීමේ කාර්ය සඳහා කතෘවරුන්ට වැටුප් හා පොත් මුද්‍රණ

ගාස්තු ලෙස වියදම් දරා තිබුණද අවුරුදු 60කට වඩා වැඩි කාලයක් ගතවී ඇති එම කාර්යය මෙතෙක් නිමකර නොතිබුණි.

**(ඈ)** බෞද්ධ විශ්වකෝෂය පිළියෙල කිරීම සඳහා ආරම්භයේ සිට මේ දක්වා පරිශීලනය කරන ලද දේශීය සහ විදේශීය විවිධ භාෂාවන්ගෙන් යුත් වටිනා පොත් 1753 ක් මෙම කාර්යාලය සතුව ඇති බව නිරීක්ෂණය විය. එහෙත් මෙම පොත් ලේඛනගත කර, ආරක්ෂිතව තබාගැනීමට සුදුසු පියවර ගෙන නොතිබුණි.

**3.8 මානව සම්පත් කළමනාකරණය**

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2016 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| **(i)** | ජ්‍යෙෂ්ඨ මට්ටම | 12 | 11 | 01 |
| **(ii)** | තෘතියික මට්ටම | 01 | - | 01 |
| **(iii)** | ද්විතියික මට්ටම | 776 | 675 | 101 |
| **(iv)** | ප්‍රාථමික මට්ටම | 36 | 26 | 10 |
| **(v)** | වෙනත්(අනියම්/ තාවකාලික/කොන්ත්‍රාත් පදනම) | 03 | - | 03 |
| | එකතුව | 828 | 712 | 116 |